# සදහම් පණිවුඩය රක් දෙරණෙහි රැව් දුන් පොසොන් දිනය

මෙයින් වසර 2324කට පෙර අද වන් දිනෙක මිහිඳු මහ රහතන් වහන්සේ සදහම් පනිවුඩය රැගෙන ලක්දිවට වැඩම කළහ. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236කට පමණ පසුව සිදුකළ තුන්වන ධර්ම සංගායනාවෙහි ප්‍රතිඵලයක් වශයෙන් ධර්මාශෝක රජුගේ පුත් අනුබුදු මිහිඳු මාහිමිපාණෝ ලක්දිවට පැමිණ සම්බුදු සසුන ස්ථාවර පද නමක් සහිතව පිහිටුවීමේ අමිල මෙහෙවරෙහි ප්‍රතිඵල වශයෙන් අද දෙවියන් සහිත ලෝකයාට බුදුරජාණන් වහන්සේගේ නිර්මල ධර්මය සුරක්ෂිත වී තිබේ.

ඔබ අප අසන පිළිපදින දහම ලොව පවතින්නේ සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක කාලයක් මුළුල්ලේ කරන ලද අපමණ පරිත්‍යාගශීලීත්වයක ප්‍රතිඵල වශයෙනි. බුදුරජාණන් වහන්සේගේ හැම සදහම් පදයක ම උන්වහන්සේ උත්කෘෂ්ට වශයෙන් පරිත්‍යාග කරන ලද ඇස්, හිස්, මස්, ලේ, දහදිය මුසු වී පවතී. ඒ අතර අවසන් භවයෙහි බුදුරජාණන් වහන්සේ සිදු කළ වසර 45ක මහඟු සේවය ද ඊට එක් වේ. මීට වසර 2560කට පමණ පෙර සම්බුදු රජාණන් වහන්සේ අනුපදිසේස නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑමෙන් පසුව මෙම උත්තරීතර දර්ශනය නොනැසී පරපුරෙන් පරපුරට දායාද කිරීමේ වගකීම ඉතා උසස් අයුරින් තම වගකීම කොට සලකා ඉටු කරන ලද්දේ මහසඟ රුවන විසිනි. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා තෙවසකට පසුව රැස් වූ පන්සියයක් පමණ මහරහතන් වහන්සේලා මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ අනුශාසකත්වයෙන් අජාසත් රජුගේ පූර්ණ දායකත්වය හා අනුග්‍රහ ඇතිව ආනන්ද මාහිමියන්ගේ හා උපාලි මාහිමියන්ගේ ධර්ම විනය මූලිකත්වයෙන් ධර්ම විනය සජ්ඣායනා කොට අසූහාර දහසක් ධර්මස්කන්ධය ඒ ඒ රහතන් වහන්සේලාට හා උන්වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍යන්ට වෙත පවරා භාණක ක්‍රමයකට රැගෙන යාමේ වගකීම ඉටු කළහ. එතැන් පටන් තවත් වසර 100ක් ගත වූ තැන යළිත් වතාවත් මහරහතන් වහන්සේලා 750 නමකගේ සහභාගීත්වයෙන් දෙවන වරට ද ධර්ම විනය සංගායනා කොට සම්බුදු සසුන තවදුරටත් සුරක්ෂිත කළහ. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236ක් ගත වූ තැන්හි තෙවන වතාවට ද මහරහතන් වහන්සේලා 1000 නමක් රැස්ව මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ මූලිකත්වය ධර්ම විනය සංගායනා කොට වසර 5000ක් යනතුරු නොනැසෙන පරිදි සම්බුදු සසුන වඩාත් ශක්තිමත් කළහ. මෙහි දී සිදු වූ විශේෂ සිද්ධියක් නම් සංගායනාවෙන් පසුව ඉන්දියාවේ ප්‍රදේශ කිහිපයකටත් ඉන් බැහැර තවත් ස්ථාන කිහිපයකටත් වශයෙන් ප්‍රදේශ නවයකට ධර්ම දූතයන් වහන්සේලා පිටත් කර යැවීමයි. මෙලෙස ධර්ම දූතයන් වහන්සේලා යැවූ ප්‍රදේශ සඳහා තෝරා ගනු ලැබූ ධර්ම දූතයන් වහන්සේලා අතර තම්බපණ්ණි නමින් එකල ප්‍රචලිතව පැවැති ලක්දිවට යැවීම සඳහා තෝරා ගනු ලැබුවේ එවකට මහා අධිරාජ්‍යයක් ගොඩනගා ගෙන සිටි තෙවන ධර්ම සංගායනාව සඳහා මූලික දායකත්වය දැක්වූ අශෝක රජතුමාගේ පුත්‍රයා වූ මහින්ද (මිහිඳු) මහරහතන් වහන්සේ වීම මෙහි සුවිශේෂී වැදගත්කමක් උසුලයි. එවකට ලක්දිව රජකළ දේවානම්පියතිස්ස හා අශෝක රජතුමා අතර පැවැති සමීප සබඳතාව මීට හේතු වන්නට ඇත.

මිහිඳු මාහිමියන් වහන්සේ ලක්දිවට පැමිණීමට ප්‍රථම උන් වහන්සේ ධර්මදූත සේවය සඳහා මූලික සූදුසුකම් හා සූදානම් වීම් සිදු කොට ඉතා උචිත මොහොතෙහි මෙහි පැමිණීම උන් වහන්සේ දූරදර්ශී භාවය ප්‍රකට කරන්නකි. තෙවන ධර්ම සංගායනාවෙන් පසුව ලක්දිවට වැඩමවීමට මිහිඳු මාහිමියන්ට ඇරැයුම් ලැබෙන විට ලක්දිව රජකරනු ලැබුවේ මුටසීව රජු විසිනි. එතුමා බෙහෙවින් වියපත් ව සිටි බැවින් ඉන්පසු ශක්තිමත් රජකු බලයට පත්වන තුරු මිහිඳු මාහිමියන් මාස කිහියක් ඉන්දියාවෙහි වැඩ සිටියහ. ඒ අතර තම මව වාසය කළ වේදිසාවට වැඩම කොට ඇයගේ සත්කාර ලබමින් ඇය ද ධර්ම දේශනා කරමින් ලක්දිවට පැමිණ සිදු කරන මෙහෙවර සඳහා සූදානම් වෙමින් කල් ගෙවූහ. ඒ අතර ලක්දිවට වැඩමවන සෙසු පිරිස සූදානම් කරවීම, ලක්දිව එකල පැවැති භාෂාවට ප්‍රගුණ කිරීම සමස්ත ත්‍රිපිටකය ම කටපාඩම් කිරීම, ත්‍රිපිටකයට අදාළ සෙසු අටුවා සම්ප්‍රදාය ද උද්ග්‍රහණය කිරීම, ලක්දිවට වැඩම කළ පසුව සිදු කරන ධර්ම දේශනා මාතෘකා සඳහා සූදානම් වීම ආදි සියලු පූර්ව කෘත්‍ය සම්පූර්ණ කළහ. ධර්ම දූතයන් වහන්සේලා පිටත් කර යැවූ සෙසු ප්‍රදේශ අතර ලක්දිව එය වඩාත් සුරක්ෂිත වූයේත් සෙසු ප්‍රදේශවල

බුදුසසුන පිරිහෙන සමයන්හි ලක්දිවිට එම ප්‍රදේශවලට බුදුසසුන යළිත් රැගෙන යාමට හැකි වූයේත් මිහිඳු මාහිමියන් වහන්සේගේ මෙම දූරදර්ශී ප්‍රඥාගෝචර ක්‍රියාවලියෙහි ප්‍රතිඵල වශයෙනි.

මුටසීව රජුගේ අවෑමෙන් ඔහු පුත් දේවානම්පියතිස්ස රාජ්‍යත්වයට පත්වීමෙන් පසුව සුදුසු අවස්ථාව පැමිණි කල්හි මිහිඳු මාහිමියන් වහන්සේ ලක්දිවට වැඩම කිරීමට තීරණය කළහ. උන් වහන්සේ සමග ඉත්තිය, උත්තිය, භද්දිය, සම්භල යන උපසපන් භික්ෂූන් වහන්සේලා ද සුමන සාමණේරයන් (සංඝමිත්තා මෙහෙණියගේ පුතා) වහන්සේ ද භණ්ඩුක නම් උපාසකයා ද වශයෙන් හත්දෙනෙක් මෙම පිරිසට ඇතුළත් වූහ. මෙලෙස පිරිස තෝරාගනු ලැබුවේ මෙම භාරදූර කාර්යයට ඉතා උචිත වන අයුරිනි. ඒ අනුව උපසපන් පස්නමක් ඇතුළත් කරගනු ලැබුවේ ලක්දිවෙහි දී උපසම්පදා විනය කර්ම සිදු කොට බුදුසසුන මැනැවින් මුල්බැස්වීමට සඳහායි. සාමණේර නමක තෝරාගනු ලැබුවේ ලක්දිවෙහි දී සාමණේර නමක උපසපන් කරවීමේ පූර්වාදර්ශය ලබාදීම සඳහායි. ගිහි උපාසකයකු තෝරාගනු ලැබුවේ උපාසකයකුගේ කාර්යභාරය ආදර්ශයෙන් ලක්දිව වැසියන්ට පෙන්වීමට හා ඔහු පැවිදි කරවන ආකාරයක දැකීමට සැලැස්වීමටයි. මෙලෙස ඉතා විධිමත් ව හා අර්ථවත් ව මුල පටන් ම ක්‍රියා කිරීම මිහිඳු මාහිමියන් වහන්සේගේ ධර්ම දූත මෙහෙවරෙහි කැපී පෙනෙන අංගයක් විය.

බුද්ධ වර්ෂ 236 (ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ) දී සපිරිවරින් ලක්දිවට වැඩම කළ මිහිඳු මහ රහතන් වහන්සේ අනුරපුර අගනගරයට සැ.8ක් දුරින් පිහිටි අම්බස්ථලයේ (මිහින්තලයේ) දී දේවානම්පියතිස්ස රජු හමු වී දූන හැඳිනගෙන රජුට ධර්ම දේශනා කළහ. මීට කලින් ධර්මාශෝක රජු ධර්මදූතයන් වහන්සේලා එවන බවට ලිපියක් එවා තිබූ බැවින් දේවානම්පියතිස්ස රජුට මිහිඳු මාහිමියන් හඳුනා ගැනීම පහසු විය. ධර්මදේශනයට ප්‍රථම රජුගේ බුද්ධිය පරීක්ෂා කිරීමට විමසූ අඹ පැනය හා ඥාති පැනය මගින් රජතුමා බුද්ධිමත් කෙනෙක් බවත් ඔහුට ධර්මය තේරුම් ගත හැකි බවත් මිහිඳු මාහිමියන්ට වැටහුණි. ඒ අනුව රජුට ප්‍රථමයෙන් දේශනා කරන ලද්දේ චුල්ලහත්ථිපදෝපම සූත්‍රයයි. බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන හැඳින ගෙන ශ්‍රද්ධා ප්‍රතිලාභය තුළින් අර්හත්වය දක්වා ධර්මයෙන් ප්‍රතිඵල නෙළා ගන්නා අයුරු ක්‍රමානුකූලව මෙම සූත්‍රයෙන් පැහැදිලි කෙරේ. ධර්මදේශනය අවසානයෙහි රජතුමා සපිරිවරින් බුදුදහම වැළඳ ගත්තේ ය. එදින රාත්‍රියෙහි මිහින්තලාවෙහි ම වැඩසිටි මිහිඳු මාහිමියන් ඇතුළු පිරිස පසුදා අනුරපුරයට වැඩම කොට රජගෙදර පිරිසට විමානවත්‍ථු පේතවත්‍ථු කථා පාදක කර ගනිමින් කම්මස්සකතා සම්මාදිට්ඨිය දියුණු වන අයුරින් ධර්ම දේශනා කළහ. ඉන්පසු සංයුත්ත නිකායේ සච්ච සංයුත්තය, බාලපණ්ඩිත සූත්‍රය, දේවදූත සූත්‍රය ආදි මාතෘකා යටතේ ධර්මදේශනා කරමින් රජු ඇතුළු පිරිසට කර්මය, සසර, විමුක්තිය ආදි තේමා යටතේ ක්‍රමයෙන් ගැඹුරට ධර්ම දේශනා පැවැත්වූහ.

පැහැදීමට පත් රජතුමා මිහිඳු මාහිමියන් ඇතුළු පිරිසට පහසුවෙන් වැඩ සිටීම සඳහා මහමෙවුනා උයන අතපැන් වත්කොට සඟසතු කොට පූජා කළේ ය. මෙය ලක්දිව ප්‍රථම සඟසතු පූජාව වූ අතර පසුකාලීනව ලාංකේය ථේරවාදී සම්ප්‍රදායයෙහි කේන්ද්‍රස්ථානය වූ මහාවිහාරය ඉදිවූයේ මෙම මහමෙවුනා උදනයෙහි ය. මිහිඳු මාහිමියන් ඇතුළ පිරිස අනුරපුරයෙහි දින 26ක් ගත කොට නැවත මිහින්තලයට වැඩම කළ අතර එදින ම රජුගේ බෑනණු කෙනෙකු වූ මහා අරිට්ඨ ඇමැතියා තවත් පනස්පස් දෙනෙකු සමඟ පැවිදි විය. මේ අනුව භික්ෂූන් වහන්සේලා 62ක් දක්වා වර්ධනය වූ අතර ඒ සෑමට වැඩ වෙසෙනු සඳහා මිහින්තලය ආශ්‍රිතව කණ්ටක චෛතිය අවට ගල්ලෙන් පවිත්‍ර කොට භික්ෂූන්ට වැඩ සිටීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීය. අරිට්ඨ ඇමැතියා ඇතුළු පිරිස පැවිදි වූ පසු යුවරජුගේ බිසව වූ අනුලා දේවිය ඇතුළු රාජකුමාරිකාවන් පැවිදි වීමට කැමැත්ත පළ කළ අතර ඒ සඳහා සංඝමිත්තා මෙහෙණිය වැඩමවීමට මිහිඳු මාහිමියෝ කටයුතු සම්පාදනය කළහ. සංඝමිත්තා මෙහෙණිය වඩින තෙක් අනුලා දේවිය ඇතුළු කාන්තාවෝ දසසිල් සමාදන් ව නගරය පසෙක් ඉදිකළ උපාසිකා ආරාමයෙහි වැඩ සිටියහ.

වස්කාලය නිමවීමෙන් පසු සර්වඥධාතු නිධන් කොට චෛත්‍යයක් ඉදිකරවීමේ අවශ්‍යතාව රජුට දන්වා සිටි අතර ඊට අවශ්‍ය ධාතූන් වහන්සේලා වැඩම කරවන ලද්දේ සුමන සාමණේරයන් වහන්සේ විසිනි. සුමන සාමණේරයට වහන්සේ දඹදිවට වැඩම කොට තම මුත්තණුවන් වූ අශෝක රජු වෙතින් බුදුරදුන්ගේ දකුණු අකුධාතුව, පාත්‍රා ධාතුව ඇතුළු සර්වඥධාතු වැඩ කරවූහ. මෙම ධාතූන් වහන්සේලා ටික

කලක් මිස්සක පර්වතයෙහි තැන්පත් කළ අතර එතැන් පටන් එම ස්ථානය චේතියගිරි (සෑගිරි) නමින් ප්‍රකට විය. පසුව දකුණු අකුධාතුව තැන්පත් කොට ථූපාරාමය ඉදි කළ අතර එය ලක්දිව වාර්තාගත ප්‍රථම චෛත්‍යය වශයෙන් මහාවංසයෙහි දැක්වේ.

මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩම කොට සමසකට පසු එනම් උඳුවප් මස සංඝමිත්තා මෙහෙණිය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් ද රැගෙන ලක්බිමට වැඩම කළහ. මේ සමඟ ජයශ්‍රී මහා බෝධියට උපස්ථාන කරනු වස් විවිධ කුලයන්ට අයත් පිරිස් ද සංඝමිත්තා මෙහෙණිය සමඟ පැමිණි අතර ඔවුන් නිසා මෙරට විවිධ කලාශිල්ප හා වෘත්තීන් ද බිහිවිය. ජයශ්‍රීමහා බෝධි රෝපණයත් සමඟ ලක්දිවට අර්ථවත් වන්දනා ක්‍රමයක් ද හඳුන්වා දෙන ලදි. ඒ මහා මහාසංස්කෘතියක් ද නිර්මාණය විය. සංඝමිත්තා මෙහෙණියගේ වැඩමවීමෙන් භික්ෂුණී ශාසනය ස්ථාපිත වීමත් සමඟ භික්ෂු - භික්ෂුණී - උපාසක - උපාසිකා යන සිව්වනක් පිරිසෙන් සැදි බෞද්ධ සමාජයක් ලක්දිව නිර්මාණය විය. මිහිඳු මාහිමියන්ගේ උදාර ශාසනික මෙහෙවර නිසා සමස්ත ලාංකේය සමාජය ම ශ්‍රද්ධාවෙන් ඉපිල ගොස් තම ශාක්තිප්‍රමාණයෙන් සම්බුදු සසුනෙහි උන්නතිය වෙනුවෙන් ක්‍රියා කළහ. ලක්දිව පාලනය කළ රජවරු විටින් විට මුළු රාජ්‍යය ම සම්බුදු සසුනට පූජා කළ අතර එනිසා ලක්දිව 'බුදුන්ගේ දේශය' 'තෙරුවනට අයිති රට' ලෙස හැඳින්විණ. ඒ අතර වැව්, කුඹුරු, ඉඩකඩම් ආදි විවිධ දෑ සම්බුදු සසුනෙහි චිරපැවැත්ම උදෙසා සැදැහැවත්හු සසුනට පූජා කරමින් සසුනට දිරි දුන්හ. රටේ සෑම තැන ම පාහේ වෙහෙර විහාර ඉදිකළ අතර සෑම ගමක ම අලංකාරවත් උස ම ස්ථානය විහාරස්ථානයට පූජා කරන්නට විය. ගමයි පන්සලයි වැවයි දාගැබැයි යන සංකේතය මත පිහිටා ධාර්මික ජීවන පැවැත්මෙන් යුතු සැදැහැවත්, දැහැමි ජනසමාජයක් රට තුළ නිර්මාණය විය. ලක්දිව ධර්ම ද්වීපය නමින් ලොව ප්‍රචලිත විය. ලක්දිව මව්පියෝ තමන්ට ලැබෙන දරුවකු ශාසනයට පූජා කිරීම තම පරම වගකීමක් යුතුකමක් මෙන් ම උදාර පුණ්‍ය කර්මයක් සේ සලකා ඉටු කළහ. මිහිඳු මාහිමියන්ට අවශ්‍ය කළේ හුදෙක් දඹදිවින් පැමිණි පිරිසෙන් මෙරටට ධර්ම කිරීම පමණක් නොව ලක්දිව උපන් දරුවන් ලක්දෙරණෙහි ම පැවිදි උපසම්පදා කරවා ඔවුන්ට ශාසනය භාරදීමයි. බුදුසසුන සැබෑ ලෙස ලක් දෙරණ මත මුල්බැස ගන්නේ එවිට බව උන් වහන්සේ අවධාරණය කළහ. ඒ අනුව සිය දහස් ගණනින් භික්ෂු පිරිස වර්ධනය වූ අතර දඹදිවින් පවා මෙරටට පැමිණ ඇතැමෙක් පැවිදි වූ අතර දඹදිව භික්ෂූහු ද ථෙරවාදී බෞද්ධ කේන්ද්‍රස්ථානය සේ සලසා මෙරටට පැමිණ තම ආධ්‍යාත්මික දියුණුව වර්ධය කර ගත්හ. වයස අවුරුදු 32දී පමණ මෙරටට වැඩම කළ මිහිඳු මාහිමියෝ නැවත දඹදිවට නොවැඩි අතර වයස 80දී උත්තිය රජ දවස පිරිනිවන් පානා තෙක් ම ලක්දිව වැඩ වෙසෙමින් උදාර ශාසනික මෙහෙවරක් ඉටු කළහ. උන් වහන්සේගේ අමිල සේවාව හේතුවෙන් 'අනුබුදු' (දෙවන බුදුන්) යන අන්වර්ථ නාමයෙන් උන් වහන්සේට ඇමැතීමට ලක්වැසියෝ හුරු වූහ.

පසු කාලීනව දේවානම්පියතිස්ස රජුගේ මුණුබුරකු වූ දුටුගැමුණු රජු දමිළයන්ගෙන් රට මුදවා මුළු රට එක්සේසත් කොට මහා වෙහෙර විහාර නිර්මාණය කොට සම්බුදු සසුන ඒකාලෝක කළහ. රුවන්වැලි සෑය, මිරිසවැටිය, ලෝවාමහා ප්‍රාසාදය වැනි නිර්මාණ ථෙරවාදී බෞද්ධ කේන්ද්‍රස්ථාන බවට පත්විය. මිහිඳු මාහිමියන්ගෙන් පැවැරුණු සම්බුදු සසුන පිළිබඳ වගකීම ලක්දිව භික්ෂූන් වහන්සේ මහත් වගකීමෙන් යුතුව තම හදවතට ගෙන දිවි දෙවැනි කොට සම්බුදු සසුන රකිමින් තමන් ද ආධ්‍යාත්මික දියුණුව පසක් කර ගත්හ. අනුරපුර සමයෙහි ඍද්ධිමත් රහතුන් ලක්දිව අහසෙහි කෙතරම් සැරිසැරුවේද යත් මිනිසුන්ට වී ටිකක් වේලා ගැනීමට පවා දුෂ්කර වූ බව ලාංකේය බෞද්ධ ඉතිහාසය සටහන් තබා ඇත. මෙබඳු ආධ්‍යාත්මික පිබිදීමකින් යුතුව පැවැති ශ්‍රී ලංකාවෙන් ලෝකයට දායාද කළ වටිනා ම දෙය නම් ශ්‍රී සද්ධර්මයයි. වළගම්බා රජසමයෙහි 12 වසරක් පුරා පැවැති නියගය හේතුවෙන් හටගත් බැමිණිතියාසාය වැනි ඉතා ම දුෂ්කර කාල වකාවනුවල පවා ලාංකේය භික්ෂූන් වහන්සේලා ජීවිත පරිත්‍යාගයෙන් යුතුව ශ්‍රී සද්ධර්මය සුරක්ෂිත කළහ. බුද්ධවර්ෂ 440 දී ධර්මවිනය ග්‍රන්ථාරූඪ කොට එය නොනැසී වසර දහස් ගණනක් තවදුරටත් එය පවත්වා ගැනීමට හැකි වූයේ ලාංකේය භික්ෂූන් වහන්සේගේ කැපවීම, දුරදක්නා නුවණ, ශ්‍රද්ධාව හා ප්‍රඥාව හේතුවෙනි. එම භික්ෂූන් වහන්සේලා වසර දෙදහසකට අධික කාලයක් කරන ලද මෙහෙවර මෙන් ම භාග්‍යවතුන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා කළ අපමණ කැපවීම උදෙසා වර්තමානයේ සිටින අපට කළ හැකි උදාර කර්තව්‍ය නම් එම දහම ශ්‍රවණය කොට සිත්හි දරා හැකි

උපරිම අයුරින් මේ ජීවිත කාලයෙහි එහි ප්‍රතිඵල ලබා ගැනීමට ක්‍රියා කිරීමත් මෙම උදාර දහම මතු පරපුරට දායාද කිරීම සඳහා කළ හැකි උපරිම දායකත්වය දැරීමත් ය. වත්මනෙහි ජීවත් වන ඔබ අප මේ සම්බුදු සසුනෙහි අවසාන පුද්ගලයා නොවන ලෙස බුදුරජාණන් වහන්සේ අපට අවවාද කළහ. එනම් ඔබගෙන් මගෙන් පසු මේ අගනා දහම වියැකී යන්නට අද ජීවත් වන අප ඉඩ නොතැබිය යුතු ය.

ලක්දිවෙන් සම්බුදු සසුනෙහි උන්නතිය වෙනුවෙන් සිදු වූ මෙහෙවර හේතුවෙන් ලාංකිකයන් නිර්මාණය කළ බෞද්ධ කොඩි ලොව සියලු බෞද්ධයන් විසින් ඒකමතික ව පිළිගෙන ඇත. ඒ අතර ප්‍රධාන බෞද්ධ උත්සවය සැමරීමට යොදා ගන්නා මැයි මස පුන් පොහෝ දිනය 'වෙසක්' නමින් සිංහල නාමය ලොව සැවොම ව්‍යවහාර කරති. මේ කරුණු දෙක ම උදෙසා ශ්‍රී ලංකාවට ප්‍රමුඛස්ථානය හිමි වී තිබීම ශ්‍රී ලාංකිකයන් මහත් අභිමානයකි.

වර්තමානයෙහි ශ්‍රී ලංකාවට අමතරව බුරුමය, තායිලන්තය, කාම්බෝජය, ලාඕසය, බංගලිදේශය, නේපාලය යන රටවල (මෙන් ම වියට්නාමයේ සුළුතරය) ථෙරවාදී මුල්බුදුසමය අනුගමනය කරන රටවල් ලෙස ප්‍රචලිත ය. මහායාන රටවල් ලෙස චීනය, ජපානය, කොරියාව, තායිවානය, වියට්නාමය, ටිබැටය යන රටවල් හැඳින්වේ. තවද ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, අප්‍රිකාව, යුරෝපය යන සෙසු මහාද්වීපයන්හි පසුගිය අඩසියවස තුළ වේගයෙන් ප්‍රචලිත වන ආගම බවට බුදුදහම පත් ව ඇත. විශේෂයෙන් බුදුදහමේ එය භාවනා ක්‍රම අත්හදා බැලීමටත් එය දෛනික ජීවිතයේ මානසික පීඩා දුරු කර ගැනීමේ නවීතම වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් ලෙසත් මනෝ වෛද්‍යවරුන් මනෝවිද්‍යා උපදේශකයන් තම පරීක්ෂණවල ප්‍රතිඵල මගින් නිර්දේශ කර තිබේ. හුදෙක් පරලොව සුගතිය හෝ විමුක්තිය සඳහා පමණක් නොව මෙලොව ජීවිතයේ අභිවෘද්ධිය සඳහා බොහෝ මැදහත් බුද්ධිමතුන් කිසිදු ආගමික හා ජාතික භේදයකින් තොරව බුදුදහමේ ඇතුළත් ඉගැන්වීම් තම ජීවිතයට සම්බන්ධ කර ගැනීමට පෙළඹී ඇත.

විශේෂයෙන් ථෙරවාදී මුල්බුදුසමයේ ආභාසය ලද පිරිසක් වශයෙන් අපගේ ආකල්පය මීට වඩා වෙනස් විය යුතු ය. එනම් බුදුරජාණන් වහන්සේ අප වෙතින් අපේක්ෂා කළ ඉහළම බුද්ධි සාපල්‍යතාව ළඟා කර ගැනීමට උත්සාහවත් විය යුතු ය. ඒ සඳහා මුලින් ධර්මය ශ්‍රවණය කොට බුදුදහම කුමක්දැයි නිවැරදි දැනුමක් ලබා ගෙන ශ්‍රැතමය ප්‍රඥාවත්, එම දහම නිරතුරුව සිහිකිරීම් වශයෙන් චින්තාමය ප්‍රඥාවත්, සමථ විදර්ශනා භාවනා වැඩීම් වශයෙන් එම දහම තම ජීවිතයට ස්ථාවර කර ගනිමින් සිහිනුවණ දියුණු කර ගැනීමටත් අප්‍රමාදීව ක්‍රියා කළ යුතුව ඇත.

අප ජීවිතයේ කෙතෙක් දුරට සාර්ථක වූවා ද යන්න තීරණය කෙරෙන ප්‍රධාන සාධකය නම් තම චිත්ත සන්තානගත ලෝභ, ද්වේෂ, මෝහ කෙතෙක් ද දුරු වූවා ද යන කරුණයි. එපමණට අප සිත්හි පවත්නා මානසික දුක් පීඩා දුරුව මානසික සුව සහනය උදාවේ. ඒ සඳහා ආරම්භයේ දී පරිත්‍යාගශීලීත්වය, මෛත්‍රිය වැඩීම, සිල්වත්බව යන කරුණු සපුරා හැකිතාක් අකුසලයෙන් වැළකී කුසලයට බරව ක්‍රියා කළ යුතුව ඇත. ඒ අතර විශේෂයෙන් පටිච්චසමුප්පාදය පිළිබඳව නුවණ වැඩෙන දැනුමකින් හා දර්ශනයකින් ක්‍රියා කිරීම ද වැදගත් වේ.

අප ජීවිතයේ යම්තාක් දුක් සැප වින්දේ ද, කිසියම් අද්දැකීමක් ලැබුණේ ද ඒ සියල්ලට මුල් වූයේ ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රිය හය ඔස්සේ රූප, ශබ්ද, ගන්ධාදි අරමුණු ලැබීමයි. එහි ස්වභාවය නම් පෙර නොතිබී හටගෙන ඉතිරි නැති නිරුද්ධවීමයි. මේ බව නොදන්නා අවිද්‍යාව හේතුවෙන් තම අද්දැකීමට කලින් එය පැවැතියා යැයි ද අද්දැකීමෙන් පසු එය ඉදිරි වූවා යැයි ද යන හැඟීම හට ගනී. එනම් නිරුද්ධ වූ පංචස්කන්ධය නිත්‍ය, සුභ, සැප, ආත්ම වශයෙන් ගැනීමයි. මෙම විපල්ලාස හෙවත් වැරදි සිතිවිලි දුරු කොට පංචුපාදානස්කන්ධයෙහි පවත්නා අනිත්‍ය, අසුභ, දුක්, අනාත්ම ස්වභාවය තේරුම් ගැනීමට අප දක්ෂ වුවහොත් එපමණට ලෝභ, ද්වේෂ, මෝහයන්ගෙන් අතමිදීමට අවකාශ උදාවේ.

# බුදුදහමේ මූලික ඉගැන්වීම්

- ධර්ම මාර්ගය ආර්භයේදීම උපදවා ගත යුතු ගුණාංග :-
    - 1. මෛත්‍රී සහගතබව 2. නුවණැතිබව 3. කපටි නැතිබව 4. මායාකාරී නොවන බව 5. ඍජුබව

        (එතු විඤ්ඤූ පුරිසො අසඨො අමායාවී උජු ජාතිකො අහමනුසාසාමි. අහං ධම්මං දෙසෙමි.' (මෙත්ත සූත්‍රයේ ද මේවා ඇතුළත් බව)
    - 1. දූඩි ලෝභය හා දොම්නස දුරු කිරීම (විනෙය්‍ය ලෝකේ අභිඤ්ඤා දෝමනස්සං)
- තෙරුවන : බුද්ධ, ධම්ම, සංඝ
- ප්‍රඥාව දියුණු කිරීමට ඉවහල් වන කරුණු හතර :

    1. කල්‍යාණ මිත්‍ර ඇසුර 2. සද්ධර්මශ්‍රවණය

    3. යෝනිසෝ මනසිකාරය 4. ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාව සම්පූර්ණ කර ගැනීම
- සම්මා දිට්ඨිය (කම්මස්සකතා සම්මා දිට්ඨිය, ආර්ය සම්මා දිට්ඨිය)
- මාර්ග දෙක : ස්වර්ග මාර්ගය (දාන, සීල, භාවනා), මෝක්ෂ මාර්ගය (ශීල, සමාධි, ප්‍රඥා)
- පටිච්ච සමුප්පාදය : 'යො බො වක්කලි ධම්මං පස්සති සො මං පස්සති, යො මං පස්සති සො ධම්මං පස්සති, ධම්මං හි වක්කලි, පස්සන්තො මං පස්ස ති. මං පස්සන්තො ධම්මං පස්සති. .... ' වක්කලි සූත්ත, සං.නි. iii, බු.ජ.ත්‍රි. 208 පිට 'වුත්තං බො පනෙතං භගවතාඃ යො පටිච්චසමුප්පාදං පස්සති, සො ධම්මං පස්සති. යො ධම්මං පස්සති සො
- චතුරාර්ය සත්‍යය (දුක්ඛ සමුදය නිරෝධ මාර්ග)
- තම විශිෂ්ට ඥානයෙන් අවබෝධ කර ගත යුතු ප්‍රධාන කරුණ :-

    පංචුපාදානස්කන්ධය (රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ)
- තම විශිෂ්ට ඥානයෙන් ප්‍රහීණ කළ යුතු ප්‍රධාන කරුණු අවිද්‍යාව හා භවතණ්හා
- තම විශිෂ්ට ඥානයෙන් වැඩිය යුතු ප්‍රධාන කරුණු සමථ හා විදර්ශනා
- තම විශිෂ්ට ඥානයෙන් සාක්ෂාත් කළ යුතු කරුණු විද්‍යා විමුක්තිය
- සතර සතිපට්ඨානය (කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා)
- ඉන්ද්‍රිය ධර්ම (සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා)
- විමුත්තායතන

    (ධර්ම ශ්‍රවණය, ධර්ම දේශනය, ධර්ම සජ්ඣායනය, ඇසූ ධර්මය නුවණින් ධර්ම මෙනෙහි කිරීම, භාවනාව) (විමුත්තායතන සූත්ත, අං.නි. 3, 32-36 පිටු)
- අවිද්‍යා සූත්‍රයේ අංග 10
    1. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය
    2. සද්ධර්මශ්‍රවණය
    3. ශ්‍රද්ධාව
    4. යෝනිසෝ මනසිකාරය
    5. සතිසම්පජඤ්ඤය (සිහිය හා නුවණ)
    6. ඉන්ද්‍රිය සංවරය
    7. ත්‍රිවිධ සුචරිතය
    8. සතර සතිපට්ඨානය (කාය, වේදනා, චිත්ත, ධම්ම යන සිව් තැන්හි සිහිය පිහිටුවා ගැනීම)
    9. සත්ත බොජ්ඣංග (සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා)
    10. විද්‍යාවිමුක්තිය
- අවසන් බුද්ධාවවාදය :

    'හන්ද'දානි භික්ඛවෙ ආමන්තයාමි වො වය ධම්මා සංඛාරා අප්පමාදෙන භික්ඛවෙ සම්පාදෙථ ....'